සියලුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

## පාසල් වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා තබන හපනුන්ට මඟ කියන

# "අදිති"

**2**

පැය 01 යි මිනි 15

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

(01) **පහත ඡේදය කියවන්න.**

ගමේ වැඩිහිටි සමිතිය විසින් අසරණ පවුලකට නිවසක් සෑදීමේ කටයුතු මීට සතියකට පෙර ආරම්භ කරන ලදි. මම ද ඉරිදා දිනයක තාත්තා සමඟ නිවස සාදන ස්ථානයට ගියෙමි.

නිවස සාදන ඉඩම ගස්වැල්වලින් බහුල ය. කිතුල් ගස් දෙකක් සහ පොල් ගස් කිහිපයක් ද වැට අයිනේ තිබූ තල් ගසක් ද සශ්‍රීක ලෙස වැඩී තිබිණ. ආසන්නයේ ගෙවල් දොරවල් බහුල ව නැතත් පෙනෙන තෙක් මානයේ තිබුණේ තවත් ගෙවල් දෙකක් පමණි. ඉඩමට ඇතුළු වන ස්ථානයේ සල් ගසක් ඇත. එහි සල්මල් පිපී තිබුණි.

මෙම ඉඩමේ කොපමණ වටිනා ගස් තිබෙනවා දැයි මට සිතුණි.

**ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

(i) ගමේ වැඩිහිටි සමිතිය විසින් ආරම්භ කරන ලද කටයුත්ත කුමක් ද?

..........................................................................................................................

(ii) ඉඩමට ඇතුළු වන ස්ථානයේ ඇත්තේ කුමක් ද? ..........................................................

(iii) ඡේදයේ සඳහන් ආකාරයට ඔවුන් නිවස සාදන ස්ථානයට ගියේ කුමන දිනයක ද?

..........................................................................................................................

(iv) ඡේදයේ සඳහන් යුගල පදයක් ලියන්න. .............................................................

(v) 'විරල' යන්නට විරුද්ධාර්ථ පදයක් ඡේදයේ සඳහන් ව ඇත. එය කුමක් ද?

..........................................................................................................................

(vi) ''සරුසාර'' යන්නට සමානාර්ථ පදයක් ඡේදයෙන් සොයා ලියන්න. ..........................

(vii) නිවස සාදන ඉඩමේ තිබෙන ගස්වර්ග දෙකක් ලියන්න.

....................................................... .............................................................

(02) **පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(i) ඔවුහු ප්‍රදර්ශනය නැරඹූවේ ය. ( )

(ii) ඌ ඉදුණු පලතුරු දෙස බැලුවේ ය. ( )

(iii) මල්ලිලා සමඟියෙන් සෙල්ලම් කළේ ය. ( )

(iv) වෛද්‍යවරිය කඩිනමින් රෝහලට ගියා ය. ( )

(v) රාත්‍රී අහසේ තරු දිලිසෙති. ( )

(03) **පහත එක් එක් ප්‍රශ්නයෙහි නිවැරදි අක්ෂර සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.**

(i) ගැහැනිය, නලාව, ගැටළුව (ii) ආකර්ශනීය, කනගාටුව, අළුවා

(iii) මොණරා, පළතුරු, මර්දනය

(04) **පහත වාක්‍ය වර්තමාන කාල ඒක වචනයට හරවා ලියන්න.**

(i) අපි උද්යෝගයෙන් වැඩ කළෙමු.

..........................................................................................................................

(ii) ක්‍රීඩිකාවෝ ක්‍රීඩා තරඟය පිළිබඳ අදහස් දැක්වූහ.

..........................................................................................................................

(05) **පහත වචනවලින් මහාප්‍රාණ අක්ෂර සහිත වචනය තෝරා ඉරක් අඳින්න.**

තණකොළ, විශිෂ්ට, ප්‍රසිද්ධ

(06) **සුදුසු විරාම ලකුණු යොදන්න.**

තාත්තේ අද මල්ලි එනවා කිවුවා නේද තාත්තා සීයාගෙන් ඇසුවේ ය

(07) **'වගකීමෙන් බේරීම' යන අදහසට ගැළපෙන ඉඟි වැකිය ලියන්න.**

.................................................................................................................................

(08) **පහත ප්‍රස්තාව පිරුළෙහි හිස්තැන් පුරවන්න.**

................................ ඉන්න ගෙම්බා වගේ.

(09) **පහත කොටුව තුළ ඇති වචන යොදා පිළිතුරු ලියන්න.**

| | | |
|---|---|---|
| කුඹුර | පෝෂණය | වෛද්‍යවරිය |
| රුවල | පුටුව | නිශ්ශබ්ද |


(i) කෙටි ඇද පාපිල්ල සහිත වචනයකි. ..........................................................................

(ii) ස්ථාන නාම පදයකි. ..........................................................................

(iii) මූර්ධජ අක්ෂර සහිත වචනයකි. ..........................................................................

(10) **එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි ඇකුරෙන් ම ලියන්න.**

(i)  | | | | | | |

(ii)  | | | | |

(11) **සිංහල අර්ථය ලියන්න.**

(i) Drumsticks - ..........................................................................

(ii) This is my Father - ..........................................................................

(12) **වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.**

many / How / are / there / flowers ..........................................................................

(13) **සිංහල අර්ථය ලියන්න.**

ඉදෝ තණ්ණීර් කුඩියුංගළ් - ..........................................................................

(14) **දෙමළ බසින් කියන ආකාරය සිංහල අකුරින් ලියන්න.**

(i) වේලාව 10 යි. - ..........................................................................

(ii) හැමෝ ම බත් කන්න. - ..........................................................................

(ලකුණු 32)


(15) පහත සංඛ්‍යාවට පෙර සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

තිස් දහස් අටසිය දහය - ..............................................

(16) 9763 සංඛ්‍යාවේ 7 ඉලක්කමෙන් නිරූපිත අගය හා 6 ඉලක්කමෙන් නිරූපිත අගය අතර වෙනස කීය ද?

.................................................................................................................................

(17) පහත නගර අතර ඇති දුර ප්‍රමාණ අනුව පිළිතුරු ලියන්න.




(i) මීගමුවේ සිට හලාවතට ඇති දුර සොයන්න. ........................................................................

(ii) කොළඹ සිට පුත්තලමට ගොස් ආපසු මහවැවට පැමිණීමට ගමන් කළ යුතු දුර කොපමණ ද?

........................................................................................................................


(18) පහත සංඛ්‍යාවලින් රටාවක් ලැබීමට ඉවත් කළ යුතු සංඛ්‍යා ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න.

2, 4, 14, 8, 16, 21, 32, 64 ..................................................

(19) කර්මාන්ත ශාලාවක සේවකයින් ගණන 3875 ක් වන අතර සේවකයින් ගණනට වඩා සේවිකාවන් 987 දෙනෙකු වැඩි නම් කර්මාන්ත ශාලාවේ සිටින මුළු සේවක සේවිකාවන් ගණන සොයන්න.

........................................................................................................................

(20) පහත දැක්වෙන්නේ තාත්තා සවස වැඩ අවසන් කර නිවසට පැමිණි වේලාවයි. එය පැය 24 ඔරලෝසු වේලාවෙන් ලියන්න.





...............................................................

(21) තාත්තා ළඟ තිබුණු රුපියල් 240 න් $\frac{1}{2}$ ක් දී පොතක් ද ඉතිරි මුදලින් $\frac{1}{4}$ ක් දී පැන්සලක් මිලට ගත් පසු තාත්තාට ඉතිරි වූ මුදල සොයන්න.

........................................................................................................................

(22) පහත රූපයේ පාට කළ කොටස 0.7 වන තෙක් ඉතිරි කොටස අඳුරු කරන්න.



(23) සීනි $250g$ ක මිල රුපියල් 55.00 ක් නම් සීනි $1kg\ 500g$ ක මිල සොයන්න.

........................................................................................................................


(24) පලතුරු යුෂ $2l\ 50ml$ ට ජලය $4l\ 750ml$ ක් යොදා බීම සකස් කළේ නම් සෑදිය හැකි බීම ප්‍රමාණය කොපමණ ද?

........................................................................................................................

(25) දොඩම් ගෙඩියක මිල රුපියල් 65.00 ක් වන අතර එක් ළමයෙකුට දොඩම් ගෙඩි 3 බැගින් ළමුන් 5 දෙනෙක් සඳහා දොඩම් බෙදා දීමට අවශ්‍ය වන මුදල සොයන්න.

..............................................................................................................................

(26) පහත ඝන වස්තු දෙකෙහි මුහුණත් හා ශීර්ෂවල එකතුව කීය ද?



..............................................................................


(27) ළමුන් 976 දෙනෙකු කණ්ඩායම් හතරකට සමසේ බෙදූ පසු එක් කණ්ඩායමක සිටින ළමුන් ගණන කොපමණ ද?

..............................................................................................................................

(28) ගයාන් උතුරු දිශාවට $20m$ ක් ගොස් තම දකුණු අත පැත්තට හැරී $10\ m$ ක් ඉදිරියට ගොස් නැවත තම දකුණු අත පැත්තට හැරී $20\ m$ ක් ගොස් නැවතී සිටියි. දැන් ඔහු සිටින්නේ ගමන ආරම්භ කළ ස්ථානයට කුමන දිශාවෙන් ද?

..............................................................................................................................

(29) පන්තියක සිසුන් පිරිසක් කැමති ආහාර වර්ග පිළිබඳ තොරතුරු පහත ප්‍රස්තාරයෙන් නිරූපණය වේ.




(i) පිට්ටුවලට වඩා බත් කෑමට කැමති සිසුන් ගණන කොපමණ වැඩි ද?

..............................................................................................................

(ii) ආහාරවලට කැමති මුළු සිසුන් ගණන කොපමණ ද? ..................................................

(ලකුණු $2 \times 15 = 30$)


➲ අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.

(30) සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ පළමු හා අවසන් පියවර පිළිවෙළින් ඇති පිළිතුර වන්නේ,
(1) ශාරීරික ලිහිල් බව හා මානසික ලිහිල් බව (2) මානසික ලිහිල් බව හා උදානය
(3) ශාරීරික ලිහිල් බව හා උදානය

(31) උප්පැන්න සහතිකයක මුල් පිටපතක් ලබා ගැනීමට යා යුතු ස්ථානය වන්නේ,
(1) ග්‍රාම නිලධාරී කාර්යාලය (2) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
(3) ප්‍රාදේශීය සභාව

(32) සිතියම්වල දුම්රිය මාර්ග, මහා මාර්ග හා අධිවේගී මාර්ගවල සම්මත වර්ණ පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) කළු, දම්, රතු (2) කළු , රතු, දම් (3) දම්, කළු , රතු

(33) පහත සංකේතය අයත් ආගමික බැතිමතුන් සමරන උත්සවයක් වන්නේ.



(1) දීපවාලී
(2) රාමසාන්
(3) පාස්කු මංගල්‍යය

(34) හොඳින් මේරූ පසු සුදු පාටින් දක්නට ලැබෙන බීජයකි.
(1) කරවිල (2) වැටකොළු (3) කොස්

(35) සැහැල්ලු බව නිසා සුළඟේ පාවී යන ලක්ෂණය සහිත බීජ වර්ගයකි.
(1) තුත්තිරි (2) වරා (3) පොල්

(36) මිනිසුන් මඟින් සතුන්ට ලබා දෙන දෙයක් වන්නේ,
(1) පලතුරු හා විශාල ගස් රෝපණය කිරීම. (2) මල් පරාගනයට දායක වීම.
(3) බීජ ව්‍යාප්තියට දායක වීම.

(37) ඒක දේශික පක්ෂියෙක් , ක්ෂීරපායි සතෙක් හා උරගයෙක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) වලිකුකුළා, හික්මීයා, මල්පුලුට්ටා (2) බුලත් හපයා, හබන් කුකුළා, කලවැද්දා
(3) කැහිබෙල්ලා, කළු වඳුරා, යක් කටුස්සා

(38) සමනලයාගේ ජීවන චක්‍රයේ අවස්ථා ගණන දැක්වෙන පිළිතුර වන්නේ,
(1) 3 (2) 4 (3) 5

(39) වරක්කලය හා මයිනහම භාවිත කරන කර්මාන්ත පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,
(1) කම්මල් කර්මාන්තය හා වඩු කර්මාන්තය
(2) වඩු කර්මාන්තය හා කම්මල් කර්මාන්තය
(3) ධීවර කර්මාන්තය හා කම්මල් කර්මාන්තය

(40) පෞද්ගලිකව පරිහරණය කරනු ලබන භාණ්ඩයක් නොවන්නේ,
(1) ලේන්සුව (2) බිත්ති ඔරලෝසුව (3) පනාව

(41) ශ්‍රි ලංකාවේ මුහුදට මායිම් නොවූ පළාත් ගණන ඇතුළත් පිළිතුර වන්නේ,
(1) 4 (2) 5 (3) 6

(42) සුසන්තිකා ජයසිංහ මහත්මිය ඔලිම්පික් පදක්කමක් දිනාගත් වර්ෂය වන්නේ,

(1) 1995 වර්ෂය (2) 2005 වර්ෂය (3) 2000 වර්ෂය

(43) ශරීරය වර්ධනය වන ආහාර කාණ්ඩය ඇතුළත් පිළිතුර වන්නේ,

(1) මස්, මාළු, බිත්තර (2) මස්, පාන්, පිට්ටු (3) ගොටුකොළ, කැරට්, ගස්ලබු

(44) ඔළිඳ කෙළිය ක්‍රීඩාව සම්බන්ධ පහත ප්‍රකාශවලින් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) පුවරුවේ එක් පසෙක සිදුරු 7 බැගින් දෙපස සිදුරු 14 ක් ඇත.

(2) මෙම ක්‍රීඩාව සඳහා එක් පිළකට 4 දෙනෙක් අවශ්‍ය වේ.

(3) එක් සිදුරකට ඔළිඳ ඇට හතර බැගින් දමනු ලබයි.

(45) ආහාර වැඩි කාලවල ඒවා අපතේ නොයවා නැවත ප්‍රයෝජනයට ගැනීම සඳහා යොදා ගන්නේ,

(1) වැඩි ආහාර අහිංසක සතුන්ට දීම. (2) වැඩි ආහාර බැහැර කිරීම.

(3) කල් තබා ගැනීමේ ක්‍රම භාවිත කිරීම.

(46) ඩෙංගු, ජලභීතිකාව, පාචනය යන රෝග බෝ කරන සතුන් පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) මදුරුවා, පූසා, ගෙමැස්සා (2) බල්ලා, මදුරුවා, පූසා

(3) ලේනා, මදුරුවා, ගෙමැස්සා

(47) ක්ෂණික ආහාර, තෙල් මිරිස් අධික ආහාර ගැනීම හා වේලාවට ආහාර නොගැනීම වැනි හේතු නිසා ඇති විය හැකි රෝගී තත්ත්වයකි.

(1) දියවැඩියාව (2) අධි රුධිර පීඩනය (3) අම්ලපිත්ත රෝගය

(48) ජල වාෂ්ප සිසිල් කිරීමෙන් ,

(1) නැවත ජලය බවට පත්වේ. (2) අයිස් බවට පත් වේ. (3) ජලය වාෂ්ප වේ.


(49) ජලය දූෂණය වන ක්‍රමයක් නොවන්නේ,

(1) අපද්‍රව්‍ය ජලයට බැහැර කිරීම.

(2) පලිබෝධ නාශක, රසායනික පොහොර ජලයට එකතු වීම.

(3) ජලයට ක්ලෝරීන් මිශ්‍ර වීමෙන්

(50) පහත ගල් කැටයම පිහිටි ස්ථානය අයත් පළාත වන්නේ,



(1) අනුරාධපුරය

(2) උතුරු මැද

(3) මධ්‍යම

(51) බස් රථයකට නැගීමට හා බැසීමට ඇති ස්ථාන පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) පිටුපස දොර හා ඉදිරිපස දොරටුව (2) ඉදිරිපස දොරටුව හා පිටුපස දොරටුව


(3) පිටුපස දොරටුව හා පිටුපස දොරටුව


(52) කාබනික පොහොර භාවිතයේ ඇති වාසියකි.


(1) විස සහිත ආහාර ගැනීමට හැකි වීම. (2) විස රහිත ආහාර ගැනීමට හැකි වීම.

(3) අධික ලෙස මුදල් වැය වීම.

(53) ළමුන් තිදෙනෙකු කළ පරීක්ෂණයක් පහත දැක්වේ. එහි විදුලි බුබුළ දැල්වෙන පිළිතුර වන්නේ,

(1) 

(2) 

(3) 

(54) දිවා හා රාත්‍රී කාලය අපට ඇති වන්නේ කුමන හේතුවක් නිසා ද?

(1) චන්ද්‍රයාගේ භ්‍රමණය නිසා (2) පෘථිවියේ භ්‍රමණය නිසා

(3) සූර්යාගේ භ්‍රමණය නිසා

(55) අතීතයේ දී තොතුරු හුවමාරු කරගත් ක්‍රමයක් නොවන්නේ,

(1) අණබෙර වැයීම (2) සතුන් මගින් (3) අන්තර්ජාලය මගින්

(56) විරිතක් වන්නේ,

(1) කෑමට පෙර අත් සේදීම. (2) වැඩිහිටියන් දුටු විට අසුනෙන් නැගිටීම.

(3) ශබ්ද නගමින් ආහාර ගැනීම.

(57) තම ප්‍රථම ශාස්ත්‍රීය ලේඛනය ලෙස " ශ්‍රී ලංකාවේ කඳු හා මිනිරන් " යන වාරික සංග්‍රහය රචනා කළ දාර්ශනිකයා වන්නේ,

(1) 

(2) 

(3) 

(58) රාජ්‍ය ලාංඡනයේ සිංහයාගෙන් අදහස් වන්නේ,

(1) සිංහල ජනතාව (2) ජාතික අභිමානය (3) රට හා විනයගරුක ජනයා

(59) ස්වාභාවික අනතුරක් නොවන්නේ,

(1) කඳු නාය යාම (2) රිය අනතුරු (3) ගංවතුර

(ලකුණු 1 × 30 = 30)

(60) ඔබ අම්මා සමග දිය නෑමට වැවට ගොස් සිටිනවා යැයි සිතන්න. අම්මා ද මඳක් ඈතින් රෙදි සෝදමින් සිටියි. එකවර ම ඔබට පෙනෙන්නේ කෙනෙකු දියේ ගිලෙමින් සිටින ආකාරයයි. එම අවස්ථාවේ ඔබ ක්‍රියා කරන්නේ කෙසේ දැයි සිතා වාක්‍ය 3 ක් ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතු ය. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය. )

(1) ..........................................................................................

..........................................................................................

(2) ..........................................................................................

..........................................................................................

(3) ..........................................................................................

..........................................................................................

(ලකුණු 06)

පැහැදිලි අත් අකුරු සඳහා ලකුණු 2 ක් ප්‍රදානය කරන්න.